# මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙයි බිතුසිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

විනෝදනී බෝරදෙනිය. බී.ආර්.අයි

## හැඳින්වීම.

ටැම් හෙවත් කුළුණු මත ඉදිකළ විහාර ටැම්පිට විහාර ලෙස හැඳින්වේ. මුලාශ්‍රයන්ට අනුව 17 වන සියවසේ ආරම්භ වූ මෙම විහාර සම්ප්‍රදාය 19 වන සියවසේ අගභාගය දක්වාම ශ්‍රී ලංකාවේ විවිධ විහාරස්ථානයන් හි නිර්මාණය කර ඇත. මහනුවර යුගයේ වාස්තු විද්‍යාව පිළිබඳ විමසීමේ දී මෙකල ඉතා ජනප්‍රිය මෙන්ම සුවිශේෂී වාස්තු විද්‍යාත්මක අංගයක් ලෙස ටැම්පිට ප්‍රතිමාඝර හඳුනාගත හැකි අතර මෙම යුගයේදී රට පුරාම ටැම්පිට ප්‍රතිමාඝර රැසක් ඉදිකර ඇත. මෙම විහාර සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය වන්නේ එහි ඇතුළත ඇති බිතුසිතුවම්ය. සෑම ටැම්පිට විහාර පිළිමගෙය තුළම අලංකාර බිතුසිතුවම් වලින් වර්ණවත් කර ඇත. මෙලෙස අලංකාර බිතුසිතුවම් සහිතව ලංකාවේ සෑම තැනම මෙම ටැම්පිට විහාර පිළිමගෙවල් ඉදිකිරීම මහනුවර යුගයේදී සිදු වී ඇති අතර මෙම විහාර සම්ප්‍රදායට අයත් විහාර වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ සබරගමුව පළාත තුළයි. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුන්දර කඳු පන්තියක් සහ වෙල්යායක් වටකරගත් මැදිලිය රජමහා විහාරය ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සංස්කෘතික සහ පාරිසරික වටිනාකම් රැසක් හඳුනාගත හැකි විහාරස්ථානයකි. මැදිලිය රජමහා විහාරයේ ඇති ටැම්පිට පිළිමගෙය මෙම විහාරයේ සුවිශේෂත්වය විදහා දක්වයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් කරවන ලදැයි සැලකෙන මෙම පිළිමගෙය මහනුවර යුගයේ වාස්තු විද්‍යාව, චිත්‍ර කලාව, ප්‍රතිමාකරණය සහ වෙනත් සංස්කෘතික ලක්ෂණ රැසක් මනාව පෙන්නුම් කරයි. අලංකාර බිතුසිතුවම් වලින් අනූන ඉතා සුවිශේෂී ටැම්පිට ප්‍රතිමාඝරයක් වන මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙයි බිතුසිතුවම් පිළිබඳව අධ්‍යනය කිරීම මෙම සාකච්ඡාවේ අරමුණයි.

## අධ්‍යයන ක්‍රමවේදය.

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර ගවේෂණ සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ යන අධ්‍යයන ක්‍රමවේදයන් යටතේ තොරතුරු රැස් කරන ලදී. ක්ෂේත්‍ර ගවේෂණ ලෙස මැදිලිය රජමහා විහාරයට ගොස් ටැම්පිට පිළිමගෙය අධ්‍යයනය කිරීම සහ ස්වාමීන් වහන්සේගෙන් සහ ගම්වාසීන්ගෙන් තොරතුරු ලබාගත් අතර මේ සම්බන්ධයෙන් ලියැවුණු සාහිත්‍ය මූලාශ්‍ර සහ ග්‍රන්ථ පරිශීලනය සහ අන්තර්ජාලය හරහා තොරතුරු ලබාගනිමින් ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදයන්ද යොදා ගන්නා ලදී.

## විමර්ශනය.

කුඩා ප්‍රමාණයේ ගල්කණු මත ශක්තිමත් දැව බාල්ක තබා ඒ මත ලෑලි අතුරා වරිච්චි බිත්ති බැඳ සාදන ලද පිළිම ගෙවල් ටැම්පිට විහාර ලෙස හඳුනාගත හැකි වේ. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාව පුරාම විවිධ ආකාරයේ වෙහෙර විහාර ඉදිවූ අතර මෙලෙස ඉදිවන ලද පිළිමගෙවල් අතර මහනුවර යුගයේ ඉතා ජනප්‍රිය වූ විහාර සම්ප්‍රදායක් ලෙස ටැම්පිට පිළිමගෙවල් හඳුනාගත හැකි වේ. සමකාලීන මූලාශ්‍රයවලට අනුව මෙම ටැම්පිට පිළිමගෙවල් 17 - 18 වන සියවස්වල ආරම්භවී 19 වන සියවසේ අග භාගය දක්වාම ශ්‍රී ලංකාවේ විවිධ විහාරස්ථානයන් හි නිර්මාණය කර ඇත. (ලංකාවේ ටැම්පිට විහාර, පු. වි. දෙ. 1999). ගල්කණු මත දැවමය බාල්ක යොදා ඒ මත ලී තට්ටුවක් අතුරා මෙම ටැම්පිට පිළිමගෙවල් සකස්කර ඇති අතර බොහෝ විට බිත්ති බැඳ ඇත්තේ වරිච්චියෙන් වේ. එය මනාව සුමට කර හුණු පිරියම්කර සකස්කර ඇත. ටැම්පිට විහාර ඇතැම් ප්‍රදේශවල දැවපිට විහාර ලෙසද හඳුන්වයි. පසුකාලීනව ප්‍රතිමාඝර

සඳහා පමණක් නොව අම්බලම්, වී අටු, පොහොය ගෙවල් හා සංඝාවාස ගොඩනැගිලි ද මෙම ටැම්පිට ක්‍රමය යොදාගෙන නිර්මාණයකර ඇති බව හඳුනාගත හැකිය. (*මැදිලිය රජමහා වෙහෙර පුවත. 40*). පිළිමගෙයි ආරක්ෂාව සඳහා මෙන්ම දැව තට්ටු යොදා ඒ මත විහාරය ඉදි කිරීම තුළ ප්‍රතිමාඝරය වේයන් වැනි කෘමි සතුන්ගෙන් වන හානි අවම වීම, වර්ෂා කාලවල ගංවතුර ගැලීම් දියෙන් යටවීම වැනි හේතුන් පදනම් කරගෙන මෙම ටැම්පිට වර්ගයේ විහාර නිර්මාණය කරන්නට ඇතැයි සිතිය හැකිය.

ටැම්පිට ප්‍රතිමාඝර පිළිබඳ අධ්‍යයනය කිරීමේදී හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ පිළිමගෙවල් අලංකාර කරගැනීම සඳහා විවිධ බිතුසිතුවම්, කැටයම්, මූර්ති ආදිය යොදාගෙන ඇති බවයි. බොහෝ ටැම්පිට විහාරවල ලී උළුවස්ස හා ලී දොරද චිත්‍ර කැටයම්වලින් අලංකාර කරඇත. මෙම විහාර සම්ප්‍රදාය මහනුවර යුගයේ ජනප්‍රිය වූ නිසාම ලංකාවේ ඇති බොහෝ ටැම්පිට පිළිමගෙවල්වල මහනුවර යුගයේ නිර්මාණාත්මක ලක්ෂණ දක්වන බිතුසිතුවම් හඳුනාගත හැකිය. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය දක්වා වර්ධනය වූ මානවයාගේ අතීතය පිළිබඳ විමසීමේ දී බිතුසිතුවම් පිළිබඳ අධ්‍යයනය ඉතාම වැදගත් වේ. මෙම බිතුසිතුවම්වල ඉතිහාසය අතීත ප්‍රාථමික ගුහා සිතුවම් දක්වා දිවයයි. දඩයම් කරමින් ගුහාවල ජීවත් වෙමින් ප්‍රාථමික ජීවන රටාවක් ගෙන ගිය අතීත මානවයා සිය පාළුව කාන්සිය මකා ගැනීමටත්, එදිනෙදා සිදුවන සුවිශේෂී සිදුවීම් සිහිපත් කිරීමටත් ඔවුන් ජීවත්වන ගුහා තුළම විවිධ රූප සටහන් ඇඳීම සිදුකර ඇත. වර්තමානයේදීද අතීත මානවයා ඇඳි විවිධ සත්ත්ව රූප, ජ්‍යාමිතික රූප සටහන් විවිධ ගුහා තුළින් හඳුනාගත හැකිය. මෙලෙස අතීත මානවයාගේ විවිධ සිතුවිලි, දෛනික ජීවන කටයුතු හා වෙනත් සාමාජීය තොරතුරු අධ්‍යයනය කිරීමේදී මෙම සිතුවම් ඉතා වැදගත් වේ. එලෙස ගුහා තුළ විවිධ රූප සටහන් ඇඳීමෙන් ඇරඹුණු සිතුවම් කලාව කාලයත් සමඟ මිනිසාගේ චින්තනයේ දියුණුවත් තාක්ෂණයේ දියුණුවත් සමඟ අලංකාර වර්ණ යොදාගෙන නිර්මාණාත්මකව ඉතා දක්ෂ ලෙසින් සිතුවම් ඇඳීම දක්වා වර්ධනය වී ඇත. එසේ වර්ධනය වූ ශ්‍රී ලංකාවේ සිතුවම් කලාවේ පිබිදීමක් ඇතිකල යුගයක් ලෙස මහනුවර යුගය හඳුනාගත හැකි වේ. මෙම යුගය තුළ පඨිාන තේමාවන් වන්නේ බුද්ධ චරිතය, ජාතක කතා, ඓතිහාසික බෞද්ධ සිදුවීම්, දේව රූප හා විවිධ මෝස්තරයන්ය. ඒ අනුව මෙම යුගයේදී බිතුසිතුවම්වල වැඩි වශයෙන් බෞද්ධාගමික පසුබිමක් දක්නට ලැබෙන අතර පසුකාලීන දේව සංකල්ප, විවිධ විශ්වාසයන් ඇදහීම් සහ මහායාන ආභාෂයන් මූලික කරගෙන අඳින ලද නිර්මාණ රැසක් හඳුනාගත හැකිය. එසේම මහනුවර යුගයේදී සිතුවම් මගින් අදහස් පඨිාශනයට මුල් තැනක් දී ඇති බව පෙනේ. මෙලෙස බිතුසිතුවම් කලාවේ පිබිදීමත් සමඟ එකල ඉදිකරන සෑම විහාරයකම මෙන් බිත්ති, උළුවස්ස, ආදී ස්ථානවල සිතුවම්වලින් අලංකාර කර බැතිමතුන් හට යම් අදහසක් ලබා දීමට සිත්තරුන් උත්සාහ කරන ලදී. ඒ හරහා මහනුවර යුගයේ ඉතා ජනප්‍රිය විහාර සංකල්පයක් වන ටැම්පිට පිළිමගෙවල් ඉදිකිරීමේදී මෙම බිතුසිතුවම්වලින් අලංකාර සහ ආගමික බවක් එයට එක් කිරීම සිදුකර ඇත. බොහෝ ටැම්පිට ප්‍රතිමාඝරයන් හී ගෘහයෙහි ඇතුළත මෙන්ම ප්‍රදක්ෂිණා පථයට මුහුණ ලා ඇති බිත්තීන් හී ද සිතුවම් ඇඳ ඇත. එසේම මූර්තිමය ද්වාරපාල රූපද ටැම්පිට ප්‍රතිමාඝරවල පොදු ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකිය. මෙලෙස අලංකාර බිතුසිතුවම් සහිත ටැම්පිට පිළිමගෙවල් හෙවත් ප්‍රතිමාඝර ලංකාව පුරා විශේෂයෙන් ම වයඹ, සබරගමුව, මධ්‍යම සහ බස්kාහිර පළාත්වල දැකිය හැකි අතර ටැම්පිට ප්‍රතිමාඝර 48ක් ලෙස වැඩිම ටැම්පිට විහාර සංඛ්‍යාවක් වාර්තා වන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයෙනි. මෙලෙස ශ්‍රී ලංකාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මහනුවර යුගයේ බිතුසිතුවම් කලාවේ අපූර්ව බව විදහා දක්වන සිතුවම්වලින් අලංකාර කර ඇති ටැම්පිට ප්‍රතිමාඝරයක් වන මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙයි බිතුසිතුවම්

පිළිබඳ මේ අධ්‍යයනය තුළින් සාකච්ඡා කිරීම අරමුණයි.

## මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙයි බිතුසිතුවම්

මහනුවර යුගයේ බිතුසිතුවම්වල විශේෂ ලක්ෂණවලින් අඳින ලද සිතුවම්වලින් යුක්ත මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙය මහනුවර යුගයට ආවේණික සාම්ප්‍රදායික බිතුසිතුවම් හැදෑරීමේදී ඉතාම වැදගත් ස්ථානයක් ලෙස හඳුනාගත හැක. පිළිමගෙයට ඇතුළුවන විටම දොරටුව දෙපස බිත්තියේ දොරටුපාල සිතුවම් දෙකක් දක්නට ලැබේ. (ඡායාරූප අංක 01). මෙම දොරටුපාල රූප දෙකෙහිම එක් අතක කඩුවක් දක්නට ලැබෙන අතර අනික් අත ඉනට තබාගෙන සිටී. ඒ අතෙහි මල් කිනිත්තක් ඇත. මෙම දොරටුපාල රූප දෙකෙහිම මහනුවර යුගයේ ශක්‍ර ආදී දෙවිවරුන්ගේ සිතුවම්වල හිසට සරසා ඇති ඔටුන්නට බෙහෙවින් සමාන අලංකාර ඔටුන්නක් හිසට පළඳා ඇත. පිළිමගෙයි ඇතුළත ඇති සිතුවම්වලට වඩා පැරණි බවක් දක්නට ලැබෙන මෙම දොරටුපාල සිතුවම් වර්තමානය වන විට දුර්වර්ණ වී අභාවයට යමින් පවතී. ඒ නිසාම මෙහි ආභරණ සළුපිළි ආදිය පිළිබඳව පැහැදිලිව දැකිය නොහැක. කෙසේ වුවද අරිම්බුව, ගල් බිංදුව වැනි මෝස්තර මෙහි ආභරණ සළුපිළි ආදිය සැරසීම සඳහා යොදාගෙන ඇති අතර රතු, කළු, සුදු, දුඹුරු ආදී වර්ණවලින් වර්ණ ගැන්වීමක් මෙහි දක්නට ඇත. මෙම දොරටුපාල සිතුවම් දෙකෙහි සුන්දරත්වය වර්තමානය වන විට නැතිවී ගොසිනි. මෙම දොරටුපාල සිතුවම් ඇති ටැම්පිට පිළිමගෙයි පිටත බිත්තිවල අතීතයේ සිතුවම් රැසක් තිබුණු බව පැවසුවද වර්තමානයේ ඒවා කිසිවක් දක්නට නොමැත. පිළිමගෙය ඇතුළේ බුදු පිළිම තබා ඇති වන්දනා කරන ප්‍රදේශයේ බිත්තිවල සිතුවම් රැසක් දක්නට ලැබේ. එහි දකුණුපස බිත්තියේ රහත් රූප 11 ක් සිතුවම්කර ඇති අතර ඒ අතර දෑතෙහි දුන්නක් සහ හීයක් අතැතිව සරසන ලද තොරණක් යට වැඩ සිටින සමන් දෙවියන්ගේ සිතුවම තරමක් විශාල ලෙසින් දක්වා ඇත. (ඡායාරූප අංක 02). එය වර්ණ ගැන්වීම සඳහා වැඩි වශයෙන් සුදු පැහැය යොදාගෙන ඇති අතර එයට පිටුපසින් සුදු පැහැති හස්ති රූපයක් දක්නට ලැබේ.

දකුණුපස බිත්තිය මෙන්ම වම්පස බිත්තිය ද රහත් රූප රැසක් චිත්‍රණය කොට ඇත. මෙහි තීරු දෙකක් ලෙස අඳින ලද රහත් රූප 13 ක් දක්නට ලැබේ. (ඡායාරූප අංක 03). ඉහළ තීරුවේ රහත් රූප වළාකුළු මත වැඩ සිටින අයුරින් දක්වා ඇත. දකුණුපස බිත්තියේ සමන් දෙවියන් මෙන් වම්පස බිත්තියේ ප්‍රධාන කොට ගෙන ඇත්තේ විශ්ණු දෙවියන්ගේ සිතුවමයි. (ඡායාරූප අංක 04). එක් අතක හක්ගෙඩියක් සහ අනික් අතෙක හලඹයක් සමඟ අත් 4කින් මෙය සිතුවම්කර ඇති අතර පසුබිමින් දේවියන්ගේ වාහනය වන ගුරුළු රුව ඇඳ ඇත. බිතුසිතුවම්වල පසුබිමේ වැඩි වශයෙන් රතු පැහැයෙන් වර්ණ ගන්වා ඇත.

ටැම්පිට විහාරවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ ඒවායෙහි වියන් සිතුවම්කර තිබීමයි. මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙයද වියන් සිතුවම්කරණයට ලක්කර ඇත. මෙහි වියන් චිත්‍ර පිළිබඳ අධ්‍යයනයේදී එය තීරු 3 ක් ඔස්සේ සිදුකර තිබේ. පිළිමගෙයි වියන් තලයේ ඇතුළුවන විටම හමුවන වියන්තල තීරුවේ සාම්ප්‍රදායික හංස රූපය ඇසුරින් සිතුවම්කර ඇති හංසාවලියක් දැකිය හැක. (ඡායාරූප අංක 05). මෙය සැරසිලි මෝස්තරයක් ලෙස නිර්මාණය කර ඇති අතර මෙහි වම්පස සහ දකුණුපස ඉර හඳ සිතුවම් කර ඇත. *(ඡායාරූප අංක 06 ,07).* වියනෙහි මැද කොටස දැක්වෙන මීලඟ තීරුවේ පළවෙනි තීරුවට වඩා වෙනස් සිතුවම් ඇඳ ඇති අතර මෙය දෙවියන් මූලික කරගෙන සිතුවම්කර ඇති බව පෙනේ. දෙව්ලොව සිතුවම් අරමුණු කරගත් මෙහි ශක්‍ර දෙවියන් ප්‍රමුඛ කරගත් මහා බ්‍රහ්ම, ඊශ්වර සහ විස්කම් යන දෙවිවරුන් සතර දෙනා අලංකාර මහල් සහිත මැදුරක් තුළ වැඩ සිටින අයුරින් සිතුවම්කර ඇත (ඡායාරූප අංක 08). මැදුරේ මැද

පද්මාසනයෙන් වැඩ සිටින ශක්‍ර දෙවියන් සිතුවම්කර ඇත. එක් අතකින් විතර්ක මුද්‍රාව දක්වා ඇති අතර අනිත් අත ඉහළට ඔසවාගෙන සිටී. දෙවිවරුන් අතුරින් දකුණුපස පළමුව විස්කම් හෙවත් විශ්වකර්ම දෙවියා ලෙසින් හඳුන්වනු ලබන දෙවියා මුහුණු පහක් සහ අත් දහයකින් යුක්තව සිතුවම් කර ඇත. මේ සෑම අතකම පන්හිඳක්, පෑන් කෙණ්ඩියක්, පිහියක්, ගිරයක් වැනි කුමක් හෝ දෙයක් රැගෙන සිටී. ඉන්පසුව අත් තුනක් සහිතව ඊශ්වර දෙවියන්ගේ සිතුවම දැකිය හැක. එක් අතකින් ත්‍රිශූලයක් දක්වා ඇත. මහා බ්‍රහ්ම රුවද මෙහිදී හඳුනාගත හැක. මෙම දෙවිවරු වැඩ සිටින ලෙස ඇඳ ඇති මැදුරෙහි වහලයට පෙති උළු සෙවිලිකර ඇති අතර කැටයම් කරන ලද ජේකඩ සහිත කුළුණු මත වහලය රඳවා ඇති අයුරක් දක්නට ලැබේ. මේ අනුව මෙම සිතුවම් තුළින් මහනුවර යුගයේ ගොඩනැගිලිවල දක්නට ලැබෙන ලක්ෂණ හඳුනාගත හැක. එසේම හින්දු සහ බෞද්ධ සාහිත්‍යයේ දේව විශ්වාස සංකලනයකින් යුක්තව මෙහි නිර්මාණයකර තිබීම සුවිශේෂී වේ. ටැම්පිට විහාරයේ බුද්ධ ප්‍රතිමාවට ඉහළින් ඇති වියන් තීරුවේ ස්වරූප කිහිපයකින් හඳුනාගත හැකි නෙළුම් මල් මෝස්තරයක් සිතුවම්කර ඇත (ඡායාරූප අංක 09). මෙම නෙළුම් මල් මෝස්තර වෘත්තයක් තුළ රේඛා වශයෙන් ඇඳ වර්ණ ගන්වා ඇත. රතු, නිල්, තැඹිලි ආදී දීප්තිමත් වර්ණ භාවිතකර ඇති අතර පසුබිම් සඳහා කළු වර්ණය යොදාගෙන ඇත. ඇතැම් තැන්වල මිශ්‍ර වර්ණයන්ද භාවිතකර ඇත. මෙලෙස මෙම වියන් චිත්‍රවල මුල්ම තීරුවක් හඳුනාගත හැක. මේ අයුරින් මෙම පිළිමගෙයි වියන් සිතුවම් තීරු 3 ක් යටතේ හඳුනාගත හැකි අතර මෙහි මුල් තීරු දෙක අතර බාල්කයේ ඉදිරිපස මුහුණේ කිඳුරු සිතුවම්ද, මීලග තීරු දෙක අතර පිහිටි පරාලයේ ඉදිරිපස නාරිලතා මල ඇසුරින් සිතුවම් කරන ලද ලියවැලක් හඳුනාගත හැක (ඡායාරූප අංක 10).

මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙයි ඇති බිතුසිතුවම් සහ වියන් තුළ ඇති සිතුවම් පිළිබඳව හඳුනාගත හැකි තොරතුරු මෙසේය. ඉතා අලංකාර මහනුවර යුගයේ සිතුවම් කලාවේ ලක්ෂණවල අපූර්වත්වය පෙන්වන මෙම සිතුවම් වර්තමානය වන විට හායනයට ලක්වෙමින් පවතී. විහාරයේ නව පිළිමගෙය සෑදීම නිසා නිසි නඩත්තුවකින් තොරව පැවතීම තුළ කාලයත් සමග මෙම සිතුවම් දුර්වර්ණ වී විනාශවෙමින් පවතී. මීට වසර කිහිපයකට ඉහත දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිළිමගෙයි ඇතුළත දුම් බැඳී අවපැහැගැන්වී තිබු සිතුවම් අපද්‍රව්‍ය හරවා ප්‍රතිසංස්කරණය කර ඇති අතර ඒ තුළින් සිතුවම්වල වර්ණය තවමත් ආරක්ෂා වී පැවතුන ද ඉන්පසු කිසිදු නඩත්තුවක් මෙහි සිදු වී නොමැති අතර ගම් වැසියන් හටද මෙහි වටිනාකම පිළිබඳ එතරම් අවබෝධයක් නොමැත. මේ නිසාම මෙම ටැම්පිට පිළිමගෙයත් එහි වටිනා බිතුසිතුවම්ද කෙමෙන් විනාශයට ලක්වෙමින් පවතී. ඉදිරිපස දොරටුපාල රූප දෙක ඉතා අවධානම් මට්ටමක පවතී. ඒ පිළිබඳව නිසි ක්‍රියාමාර්ග නොගතහොත් තව ටික කලකින් එය හඳුනාගැනීමට පවා නොහැකි වනු ඇත. පිළිමගෙයි ඇතුලේ ඇති ඇතැම් සිතුවම්වල පතුරු ගැලවී ගොස් ඇත. එසේම බිතුසිතුවම් සහිත බිත්ති තෙතමනය, උෂ්ණත්වය වැනි ස්භාවික හායනකාරක නිසා ඉරිතැලී යාම, ඇතැම් තැන්වල බිත්ති පුපුරා යාම සිදු වී ඇති අතර වේයන් වැනි කෘමි සතුන් නිවාස සෑදීම නිසා බිත්තිවලට හානි වී ඇත. අලංකාර වියන් සිතුවම් සහිත වහලයේ ලී තැනින් තැන දිරා ගොස් ඇති බව දක්නට ලැබේ. මෙලෙස වර්තමානය වන විට මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙය සහ එහි වටිනා බිතුසිතුවම් නිසි සංරක්ෂණයක් සහ නඩත්තුවක් නොමැති වීම නිසා විනාශ මුඛයට යමින් පවතින බව දක්නට ලැබේ (ඡායාරූප අංක 11,12). මේ නිසා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ අදාල බලධාරීන් තවදුරටත් මෙම විහාරයේ සිතුවම් පිළිබඳ අවධානය යොමුකර සංරක්ෂණ කටයුතු සහ දීර්ඝ කාලීන නඩත්තු කටයුතු සඳහා ක්‍රියාමාර්ග ගෙන මෙය අනාගත පරපුරට ආරක්ෂාකර ගැනීම අවශ්‍ය වේ. එසේ නොවුනහොත් තව ටික

කාලෙකින් මෙම වටිනා සිතුවම් අප රටට අහිමිවී යනු ඇත.


## නිගමනය

ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ ශ්‍රී ලංකාවේ මහනුවර යුගයේ ජනප්‍රියතම විහාර සම්ප්‍රදායක් වන ටැම්පිට පිළිමගෙවල් හඳුනාගත හැකි වේ. මෙලෙස ඉදිවන මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙයි ඇති බිතුසිතුවම් මහනුවර යුගයේ සිතුවම් කලාවේ අපූර්වත්වය විදහා දක්වයි. එසේ වුවද වර්තමානය වන විට කිසිදු නඩත්තුවක් නොමැතිවීම තුළින් ඒවා හායනයට ලක්වෙමින් පවතින අතර මේවා අනාගත පරපුර සඳහා ආරක්ෂා කිරීමට නම් බලධාරීන්ගේ අවධානය යොමුකර නිසි සංරක්ෂණ ක්‍රමවේදයක් මේ සඳහා ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බව නිගමනය කළ හැක.


## ඇමුණුම්




ඡායාරූප අංක 01 - අභාවයට යමින් පවතින දොරටුපාල සිතුවම්




ඡායාරූප අංක 02 - සමන් දෙවියන්ගේ සිතුවම




ඡායාරූප අංක 03 - තීරු දෙකක් ලෙස අඳින ලද රහත් රූප



ඡායාරූප අංක 04 - විෂ්ණු දෙවියන්ගේ සිතුවම




ඡායාරූප අංක 05 - සාම්ප්‍රදායික හංස රූපය ඇසුරින් සිතුවම්කර ඇති හංසාවලියක්




ඡායාරූප අංක 06 - වියන් තලයේ වම්පස සිතුවම්කර ඇති ඉර




ඡායාරූප අංක 07 - වියන් තලයේ දකුණුපස සිතුවම්කර ඇති හඳ




ඡායාරූප අංක 08 - ශක්‍ර දෙවියන් ප්‍රමුඛ කරගත් මහා බ්‍රහ්ම, ඊශ්වර සහ විස්කම් යන දෙව්වරුන් සතරදෙනා




ඡායාරූප අංක 09 - වෘත්තයක් තුළ රේඛා වශයෙන් ඇඳ වර්ණ ගන්වා ඇති නෙළුම් මල් මෝස්තර



ඡායාරූප අංක 10 - නාරිලතා මල ඇසුරින් සිතුවම් කරන ලද ලියවැල





ඡායාරූප අංක 11 සහ 12 තෙතමනය, උෂ්ණත්වය , වේයන් වැනි කෘමි සතුන්ගේ බලපෑම ,නිසි සංරක්ෂණයක් සහ නඩත්තුවක් නොමැති වීම ආදි විවිධ භෞතික, රසායනික සහ පාරිසරික හායනකාරක නිසා සිතුවම් සහ බිත්ති හායනයට ලක්වෙමින් පවතින අයුරු

## ආශ්‍රිත මූලාශ්‍ර.


- බණ්ඩාර ප්‍රියදර්ශන ආර්. ඩබ්., ඉලුක්ගොඩ ඥාණානන්ද ස්ථවිර. (2011) මැදිලිය රජමහා වෙහෙර පුවත. මැදිලිය රජමහා විහාරීය ප්‍රකාශන.
- සෝමවීර කමලා, (2010) මාලගිරා සංදේශය. කතෘ ප්‍රකාශන
- Bell H.C.P(1892), Archaeological survey of Ceylon, Kegalle district
- අභයවර්ධන, එච්.ඒ.පී (2002), සබරගමුව ප්‍රවේණිය : ප්‍රමුඛ ස්වභාවික, සංස්කෘතික හා ඓතිහාසික ස්ථාන, රත්නපුර සබරගමුව සංවර්ධන බැංකුව